නීති විද්‍යාලයට සිසුන් බඳවා ගැනීම:

# වයස් සීමාව ඉවත් නොකළොත් අධිකරණ ක්‍රියාමාර්ග ගන්නවා

## නීති අධ්‍යාපනය සුරැකීමේ ශිෂ්‍ය එකමුතුව කියයි

(ඩයනා උදයංගනී)

ශ්‍රී ලංකා නීති විද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේ වයස අවුරුදු 30කට සීමා කිරීම අසාධාරණ බවත්, එය ඉවත් කිරීමට අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ක්‍රියා නොකළහොත් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන බවත් නීති අධ්‍යාපනය සුරැකීමේ ශිෂ්‍ය එකමුතුවේ කැඳවුම්කරු නායක වන්නිගම මහතා පැවසීය.

මේ පිළිබඳ තම සංගමය සමග සාකච්ඡා කිරීමට අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා එකඟ වී සිටින නිසා ඔහු මෙම ගැටලුවට විසඳුම් ලබා දෙනු ඇතැයි තමා විශ්වාස කරන බව ද ඒ මහතා පැවසුවේ කොළඹදී පැවැති මාධ්‍ය හමුවක් අමතමිනි.

ජනාධිපතිවරයා ද මේ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමට බලාපොරොත්තු වන බව ද වන්නිගම මහතා සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා මෙසේ ද පැවසීය.

2010දී හා ඉන්පසුව නීති විද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයට අයදුම් කළ හැක්කේ වයස අවුරුදු 18-30 අතර වයස් කාණ්ඩයේ අයදුම්කරුවන්ට බව නීති විද්‍යාලය මගින් පළ කළ පුවත්පත් දැන්වීමක සඳහන් වෙනවා.

එහි විදුහල්පතිවරයා මෙම තීරණය ගෙන ඇත්තේ කුමන හේතුවක් නිසාදැයි වත් සඳහන් කර නැහැ. මෙයට හේතු මොනවා දැයි විදුහල්පතිවරයා ඉක්මනින් කිව යුතුයි.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 06 දරණ නීති අධ්‍යාපන සභා (සංශෝධන) පනතේ වෙනස්කම් කිරීමට නම් ඒ බව ගැසට් පත්‍රයේ සඳහන් කර පාර්ලිමේන්තු අනුමැතිය ද ලබාගත යුතුයි. නමුත් මෙහිදී ඒ කිසිවක් සිදුකර නොමැති නිසා මෙය නීති විරෝධී දෙයක් වෙනවා.

තරුණ පිරිසට ඉඩකඩ ලබාදීමේ අරමුණින් මෙම තීරණය ගත් බව නීති විද්‍යාලය කියනවා. නමුත් මෙහි ප්‍රවේශ විභාගයට මුහුණ දෙන්නන් අතුරින් වයස අවුරුදු 30ට වැඩි අය ඉන්නේ සුළු පිරිසක් පමණක් නිසා අපට මෙම හේතුව පිළිගන්න බැහැ.

නීති විද්‍යාලයේ අඩුපාඩු දුර්වලතා විශාල ප්‍රමාණයක් තිබෙනවා. පාඨමාලා ග්‍රන්ථය අඩුපාඩු රැසකින් යුක්තයි. ඒවා සකසා නොගෙන හදිසියේ මෙවන් තීරණයක් ගැනීමට හේතුව සෙවිය යුතුයි. මීට පෙර 2005 වසරේදීත් බඳවාගැනීමේ වයස අවුරුදු 35 දක්වා සීමා කිරීමට මොවුන් උත්සාහ කළා. එවර එය නැවැත්වීමට හැකි වුණා. මෙවර අවුරුදු 30ට සීමා කර දැන් එය 35 දක්වා ඉහළ නැංවීමට බලාපොරොත්තු වන බව කියනවා. මේ කරන්න හදන්නේත් පෙර උත්සාහ කළ දේමයි.

විවෘත විශ්වවිද්‍යාලයේ නීතිය හදාරන අයට වයස් සීමාවක් නැහැ. ලන්ඩනය වැනි විදේශවලින් හදාරා එන අයටත් සීමාවක් නැහැ. මේ සියලු දෙනාම දිවුරුම් දෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ නම් නීති විද්‍යාලයට පමණක් වයස් සීමාවක් දමන්නේ ඇයි යනුවෙන් ද ඒ මහතා කීය.

මෙහිදී අදහස් දැක්වූ සංගමයේ ලේකම් වසභ මඩවල මහතා පැවසුවේ, උතුරු නැගෙනහිර ගැටුම් හේතුවෙන් අධ්‍යාපන කටයුතු පමාවූ දැන් නීති විද්‍යාලයට ඇතුළත් වීමට බලාපොරොත්තු වන්නන්ට මෙමගින් අසාධාරණයක් සිදු වන බවයි.

සංගමයේ සභාපති මහේෂ් වික්‍රමනායක මහතා පැවසුවේ, ලෝකයේ ගමන් මග වෙනස් කිරීමට සමත් මෙවන් වෘත්තියක් හැදෑරීම සීමා කිරීම නොකළ යුත්තක් බවයි. මෙය බුද්ධියෙන් බුද්ධිය විනාශ කිරීමේ ත්‍රස්තවාදයක් බව ද ඒ මහතා පැවසීය.

මෙම තීරණය වෙනස් කිරීමේ හැකියාව ඇමැතිවරයාට පවතින බැවින්, ඔහු ඒ සඳහා කටයුතු කරනු ඇතැයි තමා බලාපොරොත්තු වන බව ද සභාපතිවරයා සඳහන් කළේය.

මේ පිළිබඳ සොයා බැලීම සඳහා කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙන් තමන් අමාත්‍යවරයාට ස්තුතිවන්ත වන බව ද කී ඒ මහතා, එම කමිටු සාමාජිකයින් අපක්ෂපාත තීරණයක් ගනු ඇද්දැයි යන්න ගැටලුවක් බව ද ප්‍රකාශ කළේය.